# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1979/34 - 2016 අගෝස්තු මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2016.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 6/2001(iv)

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත.**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 94 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 105 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන රීති.

සභාපතිනිය,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය,
(ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අත්සන් කරන ලදී.)

2016 අගෝස්තු මස 10 දින,
කොළඹ දී ය.

රීති

1. 2010 පෙබරවාරි මස 25 වැනි දින අංක 1642/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* අවසන්වරට සංශෝධිත 2005 සැප්තැම්බර් මස 29 වැනි දින අංක 1412/30 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩල රීති පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 8 වැනි රීතිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් -

8(1) ''රක්ෂණකරුවකු විසින් ප්‍රධාන නිලධාරියා ලෙස පත් කරනු ලබන යම් තැනැත්තකු -

(*අ*) මණ්ඩලය විසින් පිළිගනු ලබන අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් ; හෝ

(*ආ*) මණ්ඩලය විසින් පිළිගනු ලබන රක්ෂණ, මූල්‍ය, ව්‍යාපාර හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයක අවුරුදු දහයකට නොඅඩු කාර්යක්ෂම පළපුරුද්ද,

සපුරා තිබිය යුතු ය.''.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) රක්ෂණ තැරැව්කරුවකු විසින් ප්‍රධාන නිලධාරියා ලෙස පත් කරනු ලබන යම් තැනැත්තකු -

(අ) වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු හෝ අධි සාමාජිකයකු හෝ

මණ්ඩලය විසින් පිළිගනු ලබන සමාන සුදුසුකම්වලින් සමන්විත විය යුතු සහ රක්ෂණ ආයතනයක හෝ රක්ෂණ තැරැව්කාර ආයතනයක විධායක ශ්‍රේණියේ වසර පහකට නොඅඩු අදාළ පළපුරුද්ද ඇති තැනැත්තකු ; හෝ

(ආ) විධායක ශ්‍රේණියේ අවුරුදු දහයකට නොඅඩු සහ කළමනාකරණ ශ්‍රේණියේ අවුරුදු පහකට නොඅඩු වන පරිදි රක්ෂණ ආයතනයක හෝ රක්ෂණ තැරැව්කාර ආයතනයක අවුරුදු පහළොවකට නොඅඩු අදාළ පළපුරුද්ද සහිත තැනැත්තකු ; හෝ

(ඇ) රක්ෂණ ආයතනයක හෝ රක්ෂණ තැරැව්කාර ආයතනයක අවුරුදු දහයකට නොඅඩු කළමනාකරණ ශ්‍රේණියේ පළපුරුද්ද ඇති තැනැත්තකු,

විය යුතු ය.

08 - 745

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.